දික්වැල්ල ප්‍රාදේශීය සභාව
මාතර දිස්ත්‍රික්කය
-------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 25 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දිනද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට දික්වැල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

(අ) **ගිණුම්කරණ අඩුපාඩු**

-----------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේදී වැටුප් ප්‍රතිපූර්ණය වශයෙන් ලැබුණු රු.1,379,276 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ජ'නල් සටහන් අංක 3 යෙදීම නිසා සිදුවූ දෝෂයකි. |
| (ii) | සේවක ණය ලේඛනය හා මූල්‍ය ප්‍රකාශන අතර රු.569,149 ක වෙනස ඉකුත් වර්ෂයේ සමුච්චිත අරමුදලට ගලපා තිබීම සමාලෝචිත වර්ෂයේදී ද නිවැරදි කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | රු.569,149 ක වෙනස සොයා ගැනීමට කටයුතු කරමි. |
| (iii) | ඉකුත් වර්ෂයට අදාල වීථි පහන් නඩත්තු කිරීම වෙනුවෙන් ලංකා විදුලි බල මණ්ඩලයෙන් ලැබී තිබූ රු.50,000 ක මුදල සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (iv) | සමාලෝචිත වර්ෂය අවසානයට ඉඩම් හා ගොඩනැඟිලි රු.1,150,000 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | වත්කම් නිවැරදිව ප්‍රාග්ධනිත කළ යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (v) | සමාලෝචිත වර්ෂයේ මිලදී ගෙන තිබූ රු.25,000 ක් වටිනා වර්ණ මුද්‍රණ යන්ත්‍රය හා පරිත්‍යාග ලෙස ලැබී තිබූ රු.40,178 ක් වූ පොත් නිකුත් කිරීමේ කවුන්ටරය ස්ථාවර වත්කම් යටතේ ප්‍රාග්ධනිත කර නොතිබුණි. | වත්කම් නිවැරදිව ප්‍රාග්ධනිත කළ යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (vi) | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු රු.72,918 ක් වූ ස්ථාවර තැන්පතු පොලී ආදායම ගිණුම්ගත කර නොතිබුණි. | පොලී ආදායම නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (vii) | සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.2,390,150 ක දායක මුදල ගිණුම්ගත කර නොතිබුණි. | ගෙවියයුතු දායක මුදල නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ආ) නොසැසඳුනු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු. 380,205,508 ක් වූ ගිණුම් විෂයයන් 07කට අදාළ ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛන/උපලේඛනවල දැක්වෙන ශේෂ අතර, එකතුව රු.235,475,564 ක අසමානතා පැවතුණි. | අදාළ ශේෂවල වෙනස්කම් සසදා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.195,925,636 ක්වූ ගිණුම් විෂයයන් 04 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ඉදිරියේදී ලේඛනගත කරන බව දන්වා සිටිමි. |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| (i) රීති 143 | ආපසු ගෙවිය යුතු තැන්පත් ලෙජරය මාසිකව එකතු කර ශේෂයේ එකතුව ප්‍රධාන ලෙජර ගිණුම සමඟ ගැලපීම් කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | තැන්පත් ලේඛනය හා ප්‍රධාන ලෙජර් ගිණුම මාසිකව ගැලපීම් කර ඇත. |
| (ii) රීති 193 | අයවැයගත හා පරිපූරක සම්මත වැය සමග වැය විෂයයන්හි තථ්‍ය වියදම් සසඳා අතිරික්ත හා ඌනතා පිළිබඳ හේතු දැක්වෙන ප්‍රකාශයක් ගිණුම් සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |
| (ආ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි 2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය. | පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන ගොස් නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී යාවත්කාලීන කිරීමට කටයුතු කරමි. |
| (ඇ) 2015 ජුලි 10 දිනැති අංක 2/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය. | භාවිතයෙන් ඉවත් කර තිබූ වාහන 02 ක් සම්බන්ධයෙන් යොමුගත කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | වාහන අපහරණය කිරීමට කටයුතු නොකළෙමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.24,879,324 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.22,632,503 ක් විය.

**2.2** **ආදායම් පරිපාලනය**

**2.2.1** **ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 3,330,579 | 3,312,587 | 2,982,033 | 2,829,054 | 3,697,123 | 5,805,656 | 5,966,523 | 2,498,500 |
| කුලී | 4,886,100 | 4,491,445 | 4,691,447 | 1,583,180 | 4,996,100 | 4,688,694 | 4,566,433 | 1,783,182 |
| බලපත්‍ර ගාස්තු | 1,252,500 | 1,340,125 | 1,340,125 | -- | 1,136,000 | 1,292,591 | 1,292,591 | -- |
| වෙනත් ආදායම් | 19,454,181 | 21,828,643 | 14,954,688 | 76,128,243 | 31,414,735 | 33,870,641 | 11,245,403 | 69,254,288 |
| **එකතුව** | 28,923,360 | 30,972,800 | 23,968,293 | 80,540,477 | 41,243,958 | 45,657,582 | 23,070,950 | 73,535,970 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුළ ඇස්තමේන්තුගත කළ මුළු ආදායම රු.28,923,360 ක් වූ අතර බිල් කල ආදායම රු.30,972,800 ක් විය. රු.73,535,970 ක් වූ ආරම්භක හිඟය සමඟ අයවිය යුතු මුළු මුදල රු.104,508,770 ක් වුවද, සමාලෝචිත වර්ෂය තුළ රැස්කළ මුළු ආදායම රු.23,968,293 ක් වීමෙන් වර්ෂය අවසානයට මුළු හිඟය රු.80,540,477 ක් වී තිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | හිඟ ආදායම් රැස්කිරීමට කටයුතු කරමි. |

### 2.2.3 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **(අ) වරිපනම්** | | |
| සමාලෝචිත වර්ෂයේ ආරම්භයට හිඟ වරිපනම් බදු ශේෂය රු.2,545,700 ක් වූ අතර, රු.3,312,587 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමග රු.5,858,287 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂයේ මුළු අයවීම් රු.3,022,768 ක් වීම නිසා වර්ෂය අවසානයට රු.2,835,612 ක හිඟ ශේෂයක් පැවතුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | හිඟ ආදායම් රැස්කිරීමට කටයුතු කරමි. |
| **(ආ) අක්කර බදු** | | |
| ආරම්භක හිඟ අක්කර බදු ශේෂය රු.53,942 ක් වූ අතර, වර්ෂයේ බිල් කිරීම් රු.6,941 ක් විය. සමාලෝචිත වර්ෂය තුළ අයවීම් නොවූයෙන්, සමාලෝචිත වර්ෂය අවසානයට රු.60,883 ක් හිඟව පැවතුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | හිඟ ආදායම් රැස්කිරීමට කටයුතු කරමි. |

**2.2.4 කුලී**

-----

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ආරම්භක හිඟය රු.1,464,186 ක් වූ අතර, රු.4,491,445 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමග රු.5,955,631 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂයේ මුළු අයවීම් රු.4,372,451 ක් වීම නිසා, සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,583,180ක් හිඟ ශේෂයක් පැවතුණි. වර්ෂය ආරම්භයේ හිඟ ශේෂයෙන් අයවීම් සියයට 15 ක් තරම් පහළ මට්ටමක පැවතුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | හිඟ ආදායම් රැස්කිරීමට කටයුතු කරමි. |

**2.2.5 වෙනත් ආදායම්**

-----------------

**උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට උසාවි දඩ වෙනුවෙන් රු.2,183,582 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.73,944,661 ක් ලැබිය යුතුව තිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | හිඟ ආදායම් ලබා ගැනීම සඳහා ප්‍රධාන ලේකම්ගෙන් ඉල්ලීම් කර ඇත. |

**03. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1 කාර්ය සාධන ඇගයීම**

--------------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) <u>ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය</u>

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | ------------ | --------------- |
| (i) | කසළ බැහැර කිරීමේ අරමුණින් සභාව සතු අක්කර 01 පර්චස් 16 ක් වූ පොදු සුසාන භූමියක කාබනික පොහොර මධ්‍යස්ථානයක් ඉදිකර තිබූ අතර මහජන විරෝධය නිසා කාබනික පොහොර නිෂ්පාදනයක් සිදුනොකර දෛනිකව එකතු වන කසළ පෞද්ගලික ඉඩම්වලට බැහැර කර පස් දමා වසා තිබුණි. | විධිමත් ලෙස කසළ බැහැර කළ යුතුවේ. | කසල බැහැර කිරීමට නිශ්චිත ඉඩමක් නොමැත. |
| (ii) | සභාවට අයත් පොළ භූමියේ ජීව වායු ඒකකයක් ඉදිකිරීම වෙනුවෙන් පිළිසරු ව්‍යාපෘතිය යටතේ රු.999,233 ක් ප්‍රතිපූර්ණය වී තිබූ අතර, රු.1,010,712 ක මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. මෙම වියදම්වලට අමතරව සභා අරමුදලින්ද රු.11,479 ක් ගෙවා, නිමකර තිබූ ජීව වායු ඒකකය පරීක්ෂණ අවස්ථාවේදී අක්‍රීයව පැවතුණි. ඒ අනුව දරා තිබුණු රු.1,010,712 ක වියදම නිෂ්කාර්ය වී තිබුණි. | ගැටළු අදාළ ආයතනවලට යොමු කර ක්‍රියාකාරී තත්ත්වයේ පවත්වා ගත යුතුවේ. | ජීවවායු නිෂ්පාදනය ආරම්භ කරනු ලැබුවද අසාර්ථක විය. උපදෙස් ලබා ගැනීමට ආයතන කිපයකට යොමු කළද අවශ්‍ය උපදෙස් ලැබී නොමැති අතර උපදෙස් ලබා දෙන්නේ නම් ක්‍රියාත්මක කළ හැකිය. |
| (iii) | සමාලෝචිත වර්ෂය තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය වෙනුවෙන් වැටුප් හා දීමනා, ඉන්ධන හා වාහන අලුත්වැඩියා වෙනුවෙන් රු. 8,345,809 ක වියදම් දරා තිබුණි. | කසළ බැහැර කිරීම විධිමත්ව කළ යුතුවේ. | ප්‍රාදේශීය සභා පනතේ 93,94 හා 95 වගන්තිවල විධිවිධාන ප්‍රකාර වියදම් දරා ඇත. |

**(ආ) <u>තිරසර සංවර්ධන ඉලක්ක</u>**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------------- | ------------ | --------------- |
| (i) | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබූ අතර අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සභාව විසින් හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ලඟා කර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුය. | තිරසර සංවර්ධන ඉලක්ක 07 ක් හඳුනාගෙන ඇත. |
| (ii) | තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීම සඳහා සභාවේ දැනට පවතින භෞතික සම්පත් කළමනාකරණය සඳහා ක්‍රමවේදයක් සහ කාර්ය මණ්ඩලය පුහුණු කිරීමේ ක්‍රමවේදයක් හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ලඟා කර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුය. | තිරසර සංවර්ධන ඉලක්ක 07 ක් හඳුනාගෙන ඇත. |
| (iii) | තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟාවීමට අවශ්‍ය සම්පත් හා ධාරිතාවයක් අඛණ්ඩව ලබා ගැනීමට නොහැකි වීමේ අවදානම හඳුනාගෙන නොතිබූ අතර කාර්ය නියාමනය සඳහා සභාව විසින් ක්‍රමවේදයක් හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ලඟා කර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුය. | තිරසර සංවර්ධන ඉලක්ක 07 ක් හඳුනාගෙන ඇත. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------------- | ------------ | --------------- |
| (අ) | 2017 නොවැම්බර් 24 දිනැති අංක 2047 දරන ගැසට් පත්‍රයේ විධිවිධාන ප්‍රකාරව දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීම සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකර නොතිබූ අතර 2019 ජනවාරි 11 වන දින ක්ෂේත්‍ර පරික්ෂාවේදී දික්වැල්ල බෙලිවත්ත මාර්ගයේ සවිකර ප්‍රදර්ශනය කර තිබූ දැන්වීම් | ගැසට් පත්‍රයේ ප්‍රකාරව විධිමත් පරිදි කටයුතු කළ යුතුවේ. | අදාළ මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| | පුවරු 148 ක් වෙනුවෙන් රු.525,375 ක ගාස්තුවක් අයකර ගෙන නොතිබුණි. | | |
| (ආ) | සභාව විසින් පවත්වාගෙන ගිය දැන්වීම් ගාස්තු ලේඛනය අනුව මොබිටෙල් සමාගම විසින් සභා බල ප්‍රදේශය තුල දැන්වීම් පුවරු 22 ක් ප්‍රදර්ශනය කිරීමට 2017 වර්ෂයේදී රු.107,625 ක ගාස්තු ගෙවා තිබූ අතර ක්ෂේත්‍ර පරික්ෂාවට ලක්වූ මාර්ගයේ දැන්වීම් පුවරු 08 ක් ප්‍රදර්ශනය කර තිබුණද සමාලෝචිත වර්ෂයට කිසිදු ගාස්තුවක් අයකරගෙන නොතිබුණි. | බල ප්‍රදේශයේ ප්‍රදර්ශනය කර ඇති දැන්වීම් පුවරුවලින් ගාස්තු අයකළ යුතුවේ. | අදාළ මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

---

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | ------------ | --------------- |
| (අ) | **සේවක පුරප්පාඩු හා අතිරික්ත** | | |
| | සේවක සංඛ්‍යා සැළැස්මේ අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 12 ක් සම්පූර්ණ කර ගැනීමටත්, ද්විතීයික මට්ටමේ තථ්‍ය සංඛ්‍යාව තුළ වූ අතිරික්ත තනතුරුද ඇතුළත්ව 15 ක් වූ අතිරික්ත සේවක සංඛ්‍යාව විධිමත් කර ගැනීමටත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. | කාර්ය මණ්ඩලයේ අතිරික්ත තනතුරු විධිමත් කරගැනීම හා පුරප්පාඩු සම්පූර්ණ කර ගත යුතුවේ. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට පළාත් පාලන කොමසාරිස්තුමාගෙන් ඉල්ලීම් කර ඇත. |
| (ආ) | **සේවක ණය** | | |
| | සභාවේ සේවක ණය ලේඛනය අනුව වාරික ගෙවීම් පැහැර හැර ඇති සේවකයින්ගෙන් අයවිය යුතු රු.267,615 ක් වූ හිඟ ණය ශේෂ අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි. | කඩිනමින් හිඟ ණය ශේෂ අයකර ගත යුතුවේ. | රු.106,757 ක් ණය මුදල් අයවිය යුතු එක් සේවකයෙක් මිය ගොස් ඇති අතර ඉතිරි ණය මුදල් අයකර ගැනීමට ලිපි මඟින් දැනුවත් කර ඇත. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| නාගරික සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කර තිබූ 1986 මාර්තු 16 දිනැති අංක 392/7 දරන අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව අනුබෙදීමට අදහස් කරන ඉඩම් කොටස් හෝ භූමි භාගය හෙක්ටයාර් එකකට වැඩි වන අවස්ථාවලදී වීථි අත්හැරීමෙන් පසු ඉඩම් හෝ භූමි භාගයේ විශාලත්වයෙන් සියයට 10 කට නොඅඩු ප්‍රමාණයක් ප්‍රජා හා විනෝද කටයුතු සඳහා සුදුසු ස්ථානවලින් වෙන් කරනු ලැබිය යුතු වුවත් 1993 වර්ෂයේ වෙන්දේසි කරන ලද අක්කර 05 රූඩ් 02 පර්චස් 9.39 ක් (වීථි හැර) තරම් වූ ප්‍රමාණයෙන් යුක්ත ෆිනැන්ස් වත්ත නමැති ඉඩම වෙන්දේසියේදී සභාවට හිමිවිය යුතු රූඩ් 02 පර්චස් 8.94 ක ඉඩම් කොටස සභාවට ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගැසට් පත්‍රය ප්‍රකාරව ඉඩම් කොටස් සභාවට ලබාගත යුතුවේ. | මේ සම්බන්ධයෙන් සභාවේ තොරතුරු නොමැති බැවින් මෙම ඉඩමෙන් සභාවට හිමිවිය යුතු බිම් කොටස් ලබා ගැනීමට කටයුතු කිරීම හෝ නොකිරීම සම්බන්ධයෙන් නිශ්චිත පිළිතුරක් ලබාදීමට අපහසුය. |

**3.5 වත්කම් කළමණාකරණය**

**3.5.1 වත්කම් ලේඛනගත නොකිරීම**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සභාව සතු පර්චස් 50.7 ක් වූ ඉඩම් කැබලි 04 ක් ඉඩම් හා ගොඩනැඟිලි ලේඛනයට ඇතුළත් කර නොතිබුණි. | පී.එස්. 46 ආකෘතිය අනුව ලේඛනයක සභාව සතු සියලුම ඉඩම් හා ගොඩනැඟිලි විස්තර ඇතුළත් කළ යුතුවේ. | ඔප්පුවේ නිවරදාතාව තහවුරු කර ගැනීමෙන් පසු ඉඩම් හා ගොඩනැඟිලි ලේඛනයට ඇතුළත් කිරීමට කටයුතු කරමි. |
| (ආ) | සභාව විසින් සමාලෝචිත වර්ෂයේ මිලදී ගෙන තිබූ රු.7,921,915 ක් වූ ස්ථාවර වත්කම් ලේඛනගත කර නොතිබුණි. | සියලු වත්කම් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කළ යුතුවේ. | ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කිරීමට කටයුතු කරමි. |

### 3.5.2 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු ඉඩම් කැබලි 06 ක් සම්බන්ධයෙන් ඉඩම් මැනුම් කර වැටමායිම් ඉදිකිරීමට කටයුතු නොකිරීම නිසා සභාව සතු ඉඩම් කොටසේ අනවසර ඉදිකිරීම් සිදුකර තිබුණේද යන්න නිරීක්ෂණය කිරිමට නොහැකි විය. | 2007 මාර්තු 19 දිනැති අංක දපපා/15 දරන දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ උපදෙස් ලිපිය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී මායිම් ලකුණු කිරීමට කටයුතු කරමි. |

### 3.5.3 නිෂ්ක්‍රීය/ඌණ උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) අක්‍රීය බැංකු ගිණුම් | | |
| සභාව විසින් පවත්වාගෙන ගොස් තිබූ ජංගම ගිණුම් 02 කට අදාලව රු. 96,165 ක ශේෂයක් නිෂ්ක්‍රීයව පැවතුණි. | නිෂ්ක්‍රීයව පැවති මුදල් ශේෂ ඵලදායී කාර්යයකට යොදා ගත යුතුවේ. | ගිණුම් වසා දැමීමේ නිර්දේශ මහා සභා රැස්වීමට ඉදිරිපත් කර ලැබෙන තීරණය අනුව ඉදිරි කටයුතු කරමි. |
| (ආ) ඉඩම් හා ගොඩනැඟිලි | | |
| (i) සභාව සතු ඉඩම් 06 ක් කිසිදු ප්‍රයෝජනවත් කටයුත්තකට යොදවා ගෙන නොතිබූ අතර, මෙම ඉඩම් ඵලදා බදු හෝ වාර්ෂික බදු ක්‍රමයට ලබා දීමෙන් සභාවට අමතර ආදායම් ලබාගැනීම කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි. | ඵලදායී කාර්යයක් සඳහා යොදා ගත යුතුවේ. | සභාව සතු ඉඩම් නිසියාකාරව බදු දීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ii) | 1999 වර්ෂයේදී විමධ්‍යගත ප්‍රතිපාදන යටතේ ආදාහනාගාරයක් ඉදිකර තිබූ අතර මහජනයාගේ විරෝධතා හේතුවෙන් මෙම ආදාහනාගාරය භාවිතා කිරීම අතහැර දමා තිබුණි. ඒ අනුව ආදාහනාගාරය ඉදිකිරීමට පෙර ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර නොතිබීම නිසා මේ සඳහා දරන ලද වියදම නිෂ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි. | ඵලදායී කාර්යයක් සඳහා යොදා ගත යුතුවේ. | මේ සම්බන්ධයෙන් අභියාචනාධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවතී. |

(ඇ) මෝටර් රථ හා කරත්ත

---------------------------

| | | |
|---|---|---|
| සභාවට අයත් රු.2,000,000 ක් වූ ලොරි රථයක් 2014 සැප්තැම්බර් 16 දින සිට හා වටිනාකම සඳහන් නොවූ යතුරුපැදියක් 2016 දෙසැම්බර් 09 දින සිට අක්‍රිය වී තිබුණද, ඒවා අලුත්වැඩියා කර ප්‍රයෝජනයට යොදවා ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | ඵලදායී කාර්යයක් සඳහා යොදාගැනීම හෝ ප්‍රයෝජනයට ගත නොහැකි නම් අපහරණ කටයුතු සිදු කළ යුතුවේ. | ලොරි රථය වෙන්දේසි කර ඇති නමුත් වෙන්දේසියේදී විකිණී නොමැති අතර යතුරු පැදියේ අයිතිය සභාව සතුව නොමැති බැවින් වෙන්දේසි කිරීමට නොහැකි වී ඇත. |

**3.6 කොන්ත්‍රාත් පරිපාලනය**

**-------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------- | ------------ | --------------- |
| සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය අනුව සභා අරමුදල් යටතේ රු.3,000,000 ක් වූ වැඩ යෝජනා 03 ක් හා විවිධ ප්‍රතිපාදන යටතේ රු.60,000,000 ක් වූ වැඩ යෝජනා 12 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණ ද, එක් වැඩයෝජනාවක් පමණක් ඉටුකර තිබුණි. | ඇස්තමේන්තු ප්‍රකාරව කටයුතු කළ යුතුවේ.. | ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් වැඩයෝජනා ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වැය විෂයයන් 08 ක ඉතිරිවීම්වල එකතුව රු.24,427,121 ක් වූ අතර එම අගයන් සියයට 14 සිට සියයට 70 දක්වා පරාසයක පැවතුණි. | තාත්වික වන පරිදි වාර්ෂික ඇස්තමේන්තු පිළියෙළ කළ යුතුය. | අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස පත්කර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | ආදායම් විෂයක ළඟාකර නොගත් ඉලක්කවල එකතුව රු.10,502,454 ක් වූ අතර එම අගය සියයට 20 ක් විය. | තාත්වික වන පරිදි වාර්ෂික ඇස්තමේන්තු පිළියෙළ කළ යුතුය. | අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස පත්කර ගැනීමට කටයුතු කරමි. |

## 4.2 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2009 ජුනි 09 දිනැති අංක DMA/2009 (i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පවත්වා තිබුණේ රැස්වීම් 01 ක් පමණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී පැවැත්වීමට කටයුතු කරමි. |

## 4.3 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි දැක්වෙන විධිවිධානයන් සහ දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ව.ලේ දරන චක්‍රලේඛය ප්‍රකාර ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. මුදල් රෙගුලාසි 134 ප්‍රකාර අභ්‍යන්තර විගණන වැඩසටහන් පිළියෙල කිරීමේදී විගණකාධිපතිගෙන් විමසා නොතිබුණු අතර, අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |